පදියතලාව ප්‍රාදේශීය සභාව - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

පදියතලාව ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට පදියතලාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ

අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක හා සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත්වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති කුමක්ද යන්න පිළිබඳ සටහනක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.	පිළිගනිමි. 2025 දෙසැම්බර් 31 මූල්‍ය ප්‍රකාශන සඳහා ඉදිරිපත් කරන බව.	මූල්‍ය ප්‍රකාශන සමඟ ඒවා පිළියෙළ කිරීමට අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති අනාවරණය කළ යුතුය.

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ පළාත් සංවර්ධන සහයක ව්‍යාපෘතිය සහ පළාත් විශේෂ සංවර්ධන ප්‍රධාන ව්‍යාපෘති වලට අදාළව සිදු කරන ලද රු.33,913,848 ක් වටිනා ඉදිකිරීම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.	2025 වර්ෂයේ දිනට එම වටිනාකම ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරන බව.	ප්‍රාග්ධන වැය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී ආදායම රු.1,250,000 ක් ගිණුම්ගත කර නොතිබුණි.	පිළිගනිමි. ස්ථාවර තැන්පතුව කල්පිරි පොළිය 2026 දී ලැබුණු විට ඇතුළත් කරන බව.	පොලී ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් හා පළාත් සහකාර කොමසාරිස් කාර්යාලයෙන් ලද ආධාර මත මිලදී ගත් භාණ්ඩවල වටිනාකම් ගිණුම්ගතකර නොතිබුණි.	පිළිගනිමි. 2024 වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලැබුණු පරිගණකයක හා මුද්‍රණ යන්ත්‍රයක වටිනාකම පොත් වලට ඇතුලත් කර නොමැත. 2025 වර්ෂයේ අවසන් ගිණුමට ජ'නල් සටහනක් මගින් ඇතුලත් කරන බව.	සභාවට ලැබෙන වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් සංවර්ධන සහයක ව්‍යාපෘති වලට අදාළව පැවති බැංකු ගිණුමේ රු.1,608,748 ක් වූ ශේෂය මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා නොතිබුණි.	පිළිගනිමි. මෙම වර්ෂයේදී ස්ථාන මාරු වී පැමිණි නුපුහුණු නිළධාරීන් විසින් අවසන් ගිණුම සැකසීම නිසා අඩුපාඩු සිදු වී ඇති බව.	සභාව සතු සියලුම බැංකු ගිණුම් ශේෂ නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඉ)	2023 වර්ෂයට අදාළව ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.308,000 ක් ගිණුම්ගත කර නොතිබුණි.	උසාවි දඩ ආදායම වන රු.308,000 ක් මග හැරී ඇති බව.	ලැබිය යුතු ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගිණුම් විෂයන් 03 කට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උපලේඛන අනුව ශේෂයන් සහ මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් 03 ක් අතර රු.17,467,909 ක වෙනසක් පැවතුණි.	රු.17,100 ක් දක්වා තිබුණේ 2024 වර්ෂයේදී ලැබුණු පුස්තකාල තැන්පතු ප්‍රමාණයයි. 2024 ජනවාරි 01 ශේෂය රු.157,215 ක් හා 2024 දෙසැම්බර් 31 ශේෂය රු.174,315 කි. LDSP ගිණුමේ ශේෂය රු.1,609,248 ක් බව.	නොගැලපීමට හේතු සොයා නිවැරදි කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වර්ෂය තුළ උත්පාදනය කළ ශුද්ධ මුදල් ප්‍රවාහයේ නිවැරදි එකතු වටිනාකමට වර්ෂ ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ එකතු කළ පසු වටිනාකම සහ වර්ෂ අවසාන මුදල් හා මුදල් සමාන දෑ අතර රු.16,086,925ක නොසැසඳීමක් පැවතුණි.	පිළිගනිමි. නුපුහුණු නිළධාරීන් විසින් අවසන් ගිණුම සැකසීම නිසා අඩුපාඩු සිදු වී ඇති බව.	මුදල් ප්‍රවාහ ප්‍රකාශ නිවැරදිව සකස් කළ යුතුය.

1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු එකතුව රු. 687,667,170 ක් වටිනා ගිණුම් විෂයන් 12 ක් සම්බන්ධයෙන් ඉඩම් ඔප්පු, උපලේඛන, දේපළ සමීක්ෂණ වාර්තා, ශේෂ සනාථ කිරීම් සහ යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛන ඉදිරිපත් නොවීම නිසා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.	ශේෂයන් කාලයක සිට පැවත එන ශේෂයන් බව.	මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

1.7 අනුකූල නොවීම්

1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1988 ප්‍රාදේශීය සභා)මූල්‍ය හා පරිපාලන) රීති			
	(i) 5 (xii) රීතිය	මුදල් හා ගබඩා කටයුතු ඉදිරියෙදී කිරීමට මූල්‍ය හා		

	පිළිබඳව වගකිව යුතු නිලධාරීන් වෙතින් ඇපකර ලබා ගැනීමට පියවර ගෙන නොතිබුණි.	කටයුතු කරන බව.	පරිපාලන රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ii) 218 රීතිය	සභාව සතු සියලු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව සෑම වර්ෂයකටම වරක් හෝ පරීක්ෂා කරවීමට කටයුතු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී කිරීමට කටයුතු කරන බව.	මූල්‍ය හා පරිපාලන රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3 ඡේදය	වාහන ඉන්ධන දහන පරීක්ෂාව සිදු කළ යුතු වුවත් සභාව සතු වාහන 14 ක් සම්බන්ධයෙන් විසින් එලෙස කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී කිරීමට කටයුතු කරන බව.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,746,295 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 4,913,718 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		2024				**2023**			
	ආදායම් ප්‍රභවය	**ඇස්තමේන්තු ගත ආදායම්**	**බිල්කළ ආදායම්**	**රැස්කළ ආදායම්**	**දෙසැම්බර් 31 දිනට මුළු හිඟය**	**ඇස්තමේන්තු ගත ආදායම්**	**බිල්කළ ආදායම්**	**රැස්කළ ආදායම්**	**දෙසැම්බර් 31 දිනට මුළු හිඟය**
		(රු.)	(රු.)	(රු.)	(රු.)	(රු.)	(රු.)	(රු.)	(රු.)
i.	වරිපනම් හා බදු	236,000	294,000	194,540	99,460	206,000	202,250	202,250	-
ii.	කුලී	6,967,000	7,248,474	7,386,111	1,934,076	7,182,000	6,182,302	6,153,712	1,924,114
iii.	බලපත්‍ර ගාස්තු	484,000	692,700	1,441,392	475,608	322,000	484,325	484,325	-
iv.	වෙනත් ආදායම්	1,173,500	1.173,500	3,118,967	24,115	2,464,000	2,047,186	2,047,186	24,115
	එකතුව	**8,860,500**	**9,408,674**	**12,141,010**	**2,533,259**	**10,174,000**	**8,916,063**	**8,887,473**	**1,948,229**

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුලී ආදායම රු.1,934,076 ක් වූ අතර එය 2017 සිට 2024 දක්වා කාලයකට අදාළව අයකර ගත යුතුව පැවතුණි.	පිළිගනිමි. හිග ආදායම් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින කඩ කාමර නැවත පවරා ගැනීමට හා මුද්‍රා තැබූ කඩ කාමර නැවත ටෙන්ඩර් කිරීමට කටයුතු කරමින් පවතින බව.	හිග ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර ගෙවීම් පැහැර හරින්නන් සම්බන්ධයෙන් නීත්‍යානුකූල පියවර ගත යුතුය.
(ආ)	පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ හා මුද්දර ගාස්තු ආදායම රු.369,667 ක් විය.	පිළිතුරු සපයා නොමැත.	හිඟ ආදායම් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු කාරණා හඳුනාගෙන අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කර නොතිබුණු අතර 2024 දෙසැම්බර් 31 දින වන විට අතුරු ව්‍යවස්ථා 05 ක් පමණක් පනවා තිබුණි.	ඉදිරියේදී අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කරමි. අප විසින් හඳුනාගත් කරුණු සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ඇති බව.	අතුරු ව්‍යවස්ථා පනවා සභාවේ කටයුතු නීත්‍යානුකූල කර ගත යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පදියතලාව ප්‍රාදේශීය සභාව මඟින් කිරවාන ප්‍රදේශයේ පවත්වාගෙන යන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන පාරිසරික පනත යටතේ මධ්‍යම පරිසර අධිකාරියෙන් පරිසර බලපත්‍රයක් ලබාගත යුතු වුවත්, පරිසර බලපත්‍රයක් ලබා ගැනීමකින් තොරව ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය පවත්වාගෙන ගොස් තිබුණි.	මහවැලි කාර්යාල මගින් මැණුම් පිටපත ලබා දුන් විගස බලපත්‍රය ලබා ගැනීමට කටයුතු කරනු ලබන බව.	කඩිනමින් පරිසර බලපත්‍රය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	2023 වර්ෂයේ අනතුරට පත් වූ ප්‍රාදේශීය සභාවට අයත් කැබ් රථය මෙම වාර්තාව් දිනය වන විට කුණ්ඩසාලේ ඔටෝ මොබයිල් ආයතනයේ ගාල් කර තිබුණි. අදාල සිදුවීම සිදුව වසර දෙකක් ගත වුවද එම සිදුවීම සම්බන්දයෙන් මුදල් රෙගුලාසි 101 සිට 110 දක්වා වූ රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	විමර්ශණ සිදුවෙමින් පවතින බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.

3.3 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.676,235,437 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ සහ ලී බඩු සවිකිරීම් යන ස්ථාවර වත්කම් වර්ගීකරණයන්ට අනුව උපලේඛන සකස් කර එක් එක් අයිතම අනුව වටිනාකම හඳුනාගෙන ස්ථාවර වත්කම් ලේඛනවල ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී කිරීමට කටයුතු කරන බව.	සභාව සතු ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය.

(ආ)	ප්‍රාදේශීය සභාවට අයත් සුසාන භූමි 36 ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.	තක්සේරුව සඳහා යොමු කර ඇති බව.	වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
(ඇ)	සභාව සතුව පවතින රථ වාහන 08 ක් අලුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට හෝ අලුත්වැඩියා කළ නොහැකි වාහන අදාළ ආයතන වෙත ලබා දී වෙන්දේසියේ විකිණීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	ඉදිරියේදී කිරීමට කටයුතු කරන බව.	භාවිතයෙන් ඉවත් කිරීමට හෝ වෙන්දේසි කිරීමට කටයුතු කළ යුතුය.

3.4 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 සිට 6 දක්වා වූ ඡේද සහ 2023 නොවැම්බර් 30 දිනැති 02/2018 (i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 සිට 4 දක්වා වූ ඡේද ප්‍රකාරව ආයතනය විසින් සකස් කරනු ලබන මානව සම්පත් සංවර්ධන සැලැස්ම වර්ෂ ආරම්භයේ සකස් කළ යුතු වුවත් ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂයේ දී එවැනි සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.	2025 වර්ෂයට මානව සම්පත් සැලැස්මක් කරන බව.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂය අවසන් වන විට සභාවේ තනතුරු 06 ක පුරප්පාඩු 08 ක් පවතින බවත් අනුමත කාර්යය මණ්ඩලය ඉක්ම වූ ආදායම් පරීක්ෂක තනතුරක් අතිරික්තව පැවතුණි.	පිළිතුරු සපයා නොමැත.	පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු අතර අතිරික්ත සේවකයන් අනුමත කරවා ගැනීමට ක්‍රියා කළ යුතුය.
(ඇ)	සේවක ණය ලේඛනය අනුව මියගිය නිලධාරීන් දෙදෙනෙකුගේ සහ ස්ථාන මාරු වී ගිය නිලධාරියෙකුගේ එකතුව රු.226,570 ක ණය ශේෂ වසර 02 සිට වසර 05කට අධික කාලයක සිට	එක් අයකුගේ රු.213,250 ක් මරණ පාරිතෝෂිකයෙන් අය කිරීමට කටයුතු කරන අතර, අනෙක් අයගේ ණය ශේෂය සම්බන්ධව කාර්යාලය සතු ලේඛන අනුව මේ දක්වා	හිඟ ණය මුදල් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය.

අය නොවී පැවතුණි.	කිසිදු තොරතුරත් සොයා ගැනීමට නොහැකි විය. ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව.	

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය සහ මුදල් රෙගුලාසි 133(1) ප්‍රකාරව අභ්‍යන්තර විගණනය මඟින් සභාවේ සියලු කාර්යයන් ආවරණය වන පරිදි ආයතනික මෙහෙයුම් ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම සහ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා වූ ප්‍රමාණවත් නිර්දේශ සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.	පිළිගතිමි. ඉදිරියේදී කටයුතු කරන බව.	පනත ප්‍රකාරව ආයතනික මෙහෙයුම් ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම සහ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා වූ නිර්දේශ සකස්කර ක්‍රියාත්මක කළ යුතුය.

4.2 විගණන කමිටුව

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2019 ජනවාරි 12 දිනැති අංක DMA/01–2019 දරන අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ පිළිබඳ චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ සභාව විසින් විගණන සහ කළමනාකරණ කමිටු ස්ථාපිත කර කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.	පිළිගතිමි. ඉදිරියේදී කටයුතු කරන බව.	විගණන හා කළමනාකරණ කමිටුව සඳහා ක්‍රියා පටිපාටි ආරම්භ කිරීම සහ රැස්වීම් පැවැත්වීමට පියවර ගත යුතුය.

4.3 අයවැය පාලනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය සභාවේ අයවැය ගත ආදායම් වියදම් හා සත්‍ය ආදායම් වියදම් පරීක්ෂාවේදී ආදායම් විෂයන් 05 ක සියයට 06 සිට සියයට 62 දක්වා ද, වියදම් විෂයන් 07 ක සියයට 0.5 සිට සියයට 963 දක්වා ද විචලනයක්	පිළිතුරු සපයා නොමැත.	අයවැය ලේඛනය මූල්‍යමය මඟ පෙන්වීමක් ලෙස භාවිතා කළ යුතුය.

නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය මූල්‍ය මඟපෙන්වීමක් ලෙස භාවිතා කර නොමැති බව නිරීක්ෂණය විය.

4.4 තිරසාර සංවර්ධන අරමුණු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනත ප්‍රකාරව තිරසර සංවර්ධන අරමුණු හා පරමාර්ථ ළඟාකර ගැනීම සඳහා අවශ්‍ය දත්ත රැස්කර ඒ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සැලසීමට සභාව විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	මෙම සභාව සතුව පවතින මූල්‍යමය තත්වය අවම බැවින් සංවර්ධන වැඩසටහන් සඳහා වෙන් කිරීමට තරම් ප්‍රමාණවත් තරම් මුදල් අප සතුව නොමැත. මේ වන විට LDSP ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘති සිදුකර ඇති බව.	චක්‍රලේඛය ප්‍රකාරව තිරසාර සංවර්ධන පරමාර්ථ සහ අරමුණු ළඟාකර ගැනීම සඳහා අවශ්‍ය දත්ත රැස්කර එමඟින් අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සැලැසීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගත යුතුය.